**තවලම ප්‍රාදේශීය සභාව - 2023**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තවලම ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක් වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට තවලම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ දී අඩුවෙන් ගිණුම් ගතකර තිබූ වෘත්තීය හා කර්මාන්ත බදු ආදායම රු.195,320 ක් සමාලෝචිත වර්ෂයේ දී සමුච්චිත අරමුදලට ගලපා නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සභාවට අයත් වටිනාකම රු.715,713 ක ජල බවුසරය ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඇ) | ඉකුත් වර්ෂයේ ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම අතර වෙනස රු.92,879 ක් විය. | - එම - | - එම - |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට සභාවට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.153,788 ක් සහ උසාවි දඩ ආදායම රු.166,340 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | - එම - | - එම - |
| (ඉ) | ස්ථිර කාර්ය මණ්ඩල වැටුප් වියදම රු.155,906 ක් වැඩියෙන් ප්‍රතිපූර්ණය වී තිබුණ ද එය ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම් ගතකර නොතිබුණි. | - එම - | - එම - |
| (ඊ) | ඉකුත් වර්ෂයට අදාළව ඕපාත වොලිබෝල් ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සඳහා ලැබිය යුතු රු.147,000 ක රැඳවුම් මුදල් සඳහා ණයගැති ප්‍රතිපාදන සලසා නොතිබුණි. | - එම - | - එම - |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්‍ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන හා උපයෝගී ලේඛනයන්හි දැක්වෙන සේවක ණය ශේෂය අතර රු.289,236 ක වෙනසක් පැවතිණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම් හඳුනාගෙන ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| (i) 17(3) වගන්තිය | සභාව සතු ඉඩම් 31 ක් නිශ්කාර්යව පැවතුණි. | ලිං පිහිටි බොහෝ ඉඩම් කුඩා ඉඩම් කැබලි බැවින් වෙනත් කාර්යයන් සඳහා යොදා ගත නොහැකි බව. | වත්කම් ඵලදායීව භාවිතා කළ යුතුය. |
| (ii) 134(1) වගන්තිය | සභා බල ප්‍රදේශය තුළ පවතින දියුණු ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකර ගැනීම කර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් දේපළ තක්සේරුව ඉදිරියේ දී සිදුකර ගැනීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | සභාව සතු සියළු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් පරීක්ෂා කර වාර්තා කර නොතිබුණි. | ඉඩම් ගොඩනැගිලි පිළිබඳ පරීක්ෂා කර බැලීම සඳහා කමිටුවක් පත් කර ඇති බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) දකුණු පළාත්, පළාත් සභා මූල්‍ය රීති 476 හා 477 | වාහන සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | ඉදිරියේ දී වාර්ෂික වාහන සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2018 මැයි 22 දිනැති අංක SS/03/12/05 දරන චක්‍රලේඛය | වටිනාකම සම්බන්ධව තොරතුරු නොමැති සහා භූමියේ ගාල්කර ඇති අබලන් තත්ත්වයේ පැවති ගල් රෝල වසර 10 කට වැඩි කාලයක සිට නිෂ්ක්‍රීය තත්ත්වයේ පැවති අතර, මෙය අළුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු වටිනාකමට එම ගල් රෝල වෙන්දේසි නොවීම හේතුවෙන් තවමත් සභාවේ ගාල් කර ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2007 මාර්තු 19 දිනැති අංක දපස/5 දරන උපදෙස් ලිපිය | සභාව සතු ඉඩම් 42 ක් සඳහා වැට මායිම් යොදා ආරක්ෂා කර නොතිබුණි. | ඉදිරියේ දී වැට මායිම් යෙදීමට කටයුතු කරන බව. | ඉඩම් සඳහා වැට මායිම් දමා ආරක්ෂාව තහවුරු කරගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.324,491 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,258,333 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස් කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 639,840 | 666,734 | 716,150 | 252,252 | 613,199 | 463,328 | 680,492 | 301,668 |
| කුලී | 4,162,190 | 2,011,045 | 2,144,711 | 118,491 | 2,465,000 | 1,572,140 | 1,563,333 | 252,157 |
| බලපත්‍ර ගාස්තු | 395,780 | 541,969 | 541,969 | 8,800 | 489,080 | 260,156 | 260,156 | 8,800 |
| වෙනත් ආදායම් | 2,236,500 | 4,658,677 | 4,658,677 | 6,000 | 16,351,864 | 12,304,353 | 12,304,353 | 6,000 |
| | 7,434,310 | 7,878,425 | 8,061,507 | 385,543 | 19,919,143 | 14,599,977 | 14,808,334 | 568,625 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට මුළු හිඟ ආදායම රු.568,625 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.7,878,425 ක් විය. මේ අනුව වර්ෂය තුළ අයවිය යුතු මුළු ආදායම රු.8,447,050 ක් වූ අතර, අයවීම් රු.8,061,507 ක් වීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.385,543 ක හිඟ ශේෂයක් විය. | ඉඩම් පිළිබඳ සමීක්ෂණයකින් පසු අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අය කර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ අක්කර බදු ශේෂය තුළ රු.63,120 ක වටිනාකමින් යුක්ත වර්ෂ 03 ක් ඉක්ම වූ ශේෂ 116 ක් ඇතුළත්ව තිබුණි. | ඉඩම් සමීක්ෂණයක් සිදු කර අක්කර බදු අය කර ගැනීමට කටයුතු කරන බව. | දීර්ඝකාලීනව හිඟව පවතින ශේෂ අය කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.116,584 ක් හා මුද්දර ගාස්තු රු.11,222 ක් විය. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් අය කර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉන්ධන දහන පරීක්ෂාව සිදු කරන ලද තොරතුරු වාහන ලොග් පොතෙහි සඳහන් කර නොතිබුණු අතර, එම පරීක්ෂණ වාර්තා සභාව සතුව නොතිබුණු බැවින් ඉන්ධන දහනය නිවැරදිව සනාථ කර ගැනීමකින් තොරව 2023 වර්ෂයේ වාහන 05 ක් සඳහා රු.2,291,770 ක් වටිනා ඉන්ධන ලබා දීමට කටයුතු කර තිබුණි. | ඉන්ධන දහන පරීක්ෂාව සිදු කරමින් පවතින බව. | ඉන්ධන දහනය සනාථ කරගෙන වාහන සඳහා ඉන්ධන නිකුත් කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වීථි පහන් නඩත්තුව සඳහා රු.244,186 ක වියදමක් දරා තිබුණ ද, වීථි පහන් නඩත්තු කටයුතු අධීක්ෂණය පිළිබඳ ලිඛිත වාර්තා තබා ගැනීමක් සිදුකර නොතිබුණි. | අධීක්ෂණය පිළිබඳ ලේඛනයක් දිගින් දිගට පවත්වාගෙන යන බව. | අධීක්ෂණය කාලීනව සිදුකළ යුතුය. |
| (ආ) | ආයතන 63 ක් පරිසර බලපත්‍ර ලබා නොගැනීම නිසා එමඟින් පරිසරයට වන හානිය පිළිබඳ සභාවේ අවධානය යොමු වී නොතිබුණු බව හා බලපත්‍ර ගාස්තු වශයෙන් රු.283,500 ක් හා පරීක්ෂණ ගාස්තු වශයෙන් රු.189,000 ක් සභාව අය කරගෙන නොතිබුණු බව ද දක්නට ලැබුණි. | ඉදිරියේ දී බලපත්‍ර ලබා දී ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | පාරිසරික බලපත්‍ර නිකුත් කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.464,634 ක් වටිනා ඉඩම් 41 කට අදාළ හිමිකම් ඔප්පු සභාව සතුව නොතිබුණු අතර, එම ඉඩම් පවරාගෙන අයිතිය නිරවුල් කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | දැනට පත් කරන ලද කමිටුව මඟින් එම ඉඩම් සභාව සතු ද යන්න හඳුනාගෙන එම ඉඩම් සභාවට පවරා ගැනීමට කටයුතු කරන බව. | සභාව සතු ඉඩම් පවරා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛන පරීක්ෂාවේ දී ඉඩම් 08 ක වටිනාකම් හඳුනාගත නොහැකි වූ අතර, ඉඩම් 42 කට අදාළව වර්තමාන වෙළඳපොල වටිනාකම හඳුනාගෙන ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් තක්සේරුවකින් පසුව ලේඛනගත කිරීමට කටයුතු කරන බව. | වටිනාකම තක්සේරු කර ලේඛන ගත කළ යුතුය. |
| (ඇ) | 2014 වර්ෂයේ ලබා දී තිබුණු පිරිවැය රු.6,390,000 ක් වූ කැබ් රථය ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණ අතර 2022 මැයි 09 දින කොළඹ අරලියගහ මන්දිරයේ පැවති උත්සවයට සහභාගී වී පැමිණීමේ දී කිසියම් පුද්ගලයින් පිරිසක් විසින් කැබ් රථය සම්පූර්ණයෙන් අලාභ හානි සිදුකර තිබුණ ද මේ සඳහා රක්ෂණ වන්දි ලැබී නොතිබුණි. | කැබ් රථයේ රක්ෂණ වන්දි ලැබීම සම්බන්ධව මේ වන විට කටයුතු සිදු කෙරෙමින් පවතින බව. | රක්ෂණ වන්දි ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2014 වර්ෂයේ ලැබී තිබූ රු.2,655,318 ක් වටිනා foton ට්‍රැක්ටරයේ එන්ජිම ක්‍රියා විරහිතවීමෙන් 2016 වර්ෂයේ සිට අක්‍රීය තත්ත්වයේ පැවතුණු අතර, මෙම රථය ධාවනය වී තිබුණුයේ කි.මී.1000 ට අඩු ප්‍රමාණයක් විය. | නඩත්තු කටයුතු ප්‍රමාද වීමට ප්‍රධානතම හේතුව වූයේ සභා අරමුදලේ ප්‍රමාණවත් නොවීම බව. | අළුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාර්ග සංවර්ධනය කිරීමේ කර්මාන්ත 07 ක් සඳහා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2023 වර්ෂයේ දෙවන භාගයේ හඳුන්වා දී තිබුණු (අගෝස්තු) මිල අනුපාත භාවිතා කළයුතු වුවද, එම මිල අනුපාත භාවිතා නොකිරීම නිසා රු.371,728 ක් වැඩිපුර ගෙවා තිබුණි. | පළාත් පාලන කොමසාරිස් 3/9/7 හා 2023 නොවැම්බර් 17 දිනැති ලිපිය ප්‍රකාරව කටයුතු සිදුකර ඇති බව. | නියමිත මිල අනුපාත භාවිතා කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සේවය කර විශ්‍රාම ගිය, සේවය අත්හැර ගිය නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු රු.27,111 ක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | ණය ශේෂ අයකර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (ද.ප) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපප/යහ/01/නා.ව.ලෙ. දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන රාජකාරි නිසි ලෙස ඉටු කර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් පවත්වා තිබුණ ද, තීරණ නිසි පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි. | තීරණ කිහිපයක් ක්‍රියාත්මක කර ඇති අතර, ඉතිරි තීරණ ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |